| මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013 | | |
|---|---|---|
| **පාලි භාෂාව - II පත්‍රය** | **5 වසර** | **කාලය පැය 3 යි** |
| * 1, 2 ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. | | |

(1) i. චූල්ලතිස්ස කථා වස්තුවේ දැක්වෙන පරිදි පැවිදි දිවියේ ඇති කර ගතයුතු ශාසනික ප්‍රතිපත්ති දෙක (ධුර දෙක) ලියන්න.

ii. අක්කොච්ඡිමං අවධිමං යන ගාථා ධර්මයට අර්ථ සැපයූ කථා වස්තුව නම් කරන්න.

iii. උඩරට අමරපුර නිකායේ ව්‍යාප්තිය දැක්වෙන ස්ථාන 8 ක් අභිනව ශාසන වංශය ඇසුරින් දක්වන්න.

iv. පාලි වංශ කථා දෙකක් හා ඒවායේ කතුවරු නම් කරන්න.

v. සූත්‍ර පිටකයට අයත් ග්‍රන්ථ පහ නම් කරන්න.

vi. අයං ධම්ම දේසනං කත්‍ථ භාසිතන්ති ? සාවත්‍ථියං. කං ආරබ්භාති ? චක්ඛුපාලථේරං. අර්ථ දක්වන්න.

vii. ගාථා පරියෝසානේ යක්ඛිණී සෝතාපත්ති ඵලේ පතිට්ඨහි.සම්පත්ත පරිසායපි දේසනා සාත්‍ථිකා අහෝසි. අරුත් දක්වන්න

viii. බදුල්ල දේසේ ගිරිනිජ්ඣරුජ්ජලේ පසිද්ධ කන්දේගෙදරව්හ ගාමකේ. අරුත් දක්වන්න

ix. අපුබ්බභූතං උදපාදි අබ්භුතං ජනා පමෝදිංසු නදිංසු කෝකිලා. අර්ථ දක්වන්න.

x. පූර්වාපර සන්ධි ගැලපීම යනු කුමක් ද? (ලකුණු 4×10=40)

(2) සිංහලයට නගන්න.

(අ) සත්‍ථාපි අනුපුබ්බේන ජේතවනං අගමාසි.කෝසම්බකා භික්ඛූ 'සත්‍ථා කිර සාවත්‍ථිං ආගතෝ'ති. සුත්‍වා සත්‍ථාරං ඛමාපේතුං තත්‍ථ අගමංසු. කෝසල රාජා තේ කිර කෝසම්බකා භණ්ඩනකාරකා භික්ඛූ ආගච්ඡන්තී''ති සුත්‍වා සත්‍ථාරං උපසංකමිත්‍වා අහං භන්තේ තේසං මම විජිතං පවිසිතුං න දස්සාමි.''මහා රාජ ! සීලවන්තා තේ භික්ඛූ කේවලං අඤ්ඤමඤ්ඤං විවාදේන මම වචනං න ගණ්හිංසු.ඉදානි මං ඛමාපේතුං ආගච්ඡන්ති. ආගච්ඡතු මහා රාජාති. (කෝසම්බක කථා)

(ආ) හට්ඨතුට්ඨා ගහෙත්‍වාන - ධාතුයෝ තා නරාධිපා
ගන්ත්‍වා සකේ සකේ රට්ඨේ - චේතියානි අකාරයුං
ඒකා දාඨා සුරින්දේන - ඒකා ගන්ධාර වාසිහි
ඒකා භුජංගරාජූහි - ආසි සක්කත පූජිතා (දාඨාවංසය ii පරි. 55,56 ගාථා)

(ඇ) උදේති ගිම්හානපරෝ සනාගමෝ තපාභිභූතා සුඛිතා භවන්ති හි
නිසාය අන්තේ දිවසෝ උදායතේ තදංසුමාලී ජුතියා විරෝචතේ
තථා ඡවස්සුග්ගත භේදසංකුලා නිකායපුබ්බාචලතෝධුනෝදිතෝ
බුධාවතංසෝ වජිරෝපලත්‍රජෝ පියාදිතිස්සථවිරෝ දිවාකරෝ

(අභිනව vi. පරි. 1, 2 ගාථා )

(ලකුණු 10 × 3 = 30)

(3) දාඨාවංශයේ සංඥාදී පඤ්චකය ඇතුළත් වන පරිදි පරිපූර්ණ හැඳින්වීමක් කරන්න.
(ලකුණු 10)

(4) සාර්ථක භික්ෂු ජීවිතයකට ධම්මපදට්ඨාගත ධර්මෝපදේශයන්ගේ ඇති වටිනාකම අගය කරන්න. (ලකුණු 10)

(5) සංගායනාත්‍රය පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ලකුණු 10)

(6) දාඨාවංශ කතුවරයාගේ කවිත්වය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 10)

(7) වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව ධම්මපදට්ඨ කථාවේ කථාවක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(8) විදුරපොල පියතිස්ස නාහිමියන්ගේ සාහිත්‍ය සේවය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 10)

The National e-Learning Portal for The General Education